# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 11,780—1959 ජූනි 22 වැනි සඳුදා—22.6.1959**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිඬ කරන ලදි)**


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## මිළ පාලන දැන්වීම්

**කේ.ඩී. 72 වෙනි අංකය දරණ ආහාර මිළ නියෝගය** — **සහල්—තොග සහ සිල්ලර**

**1950හේ අංක 29 දරණ මිළ පාලන පනත**

**නියෝගය**

මහනුවර දිස්ත්‍රික්කයේ සහ නුවරඑළිය දිස්ත්‍රික්කයේ උඩ හේවාහැට ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගේ කොට්ඨාශයේ නියෝජ්‍ය ආහාර මිළ පාලක තැන්පත් ඇලන් බැසිල් සැමුවෙල් තේසරාජා පුල්ලෙනායගම් වන මම, 1950 හේ අංක 29 දරණ මිළ පාලන පනතේ 4 වෙනි වගන්තියත් සමඟ කියැවෙන 3(2) වෙනි වගන්තියෙන් නියෝජ්‍ය ආහාර මිළ පාලක තැනට පැවැරී ඇති බලතල අනුව—

(1) අංක 11,665 හා 1959 යේ පෙබරවාරි මස 13 වෙනි දින දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රකාශිත මහනුවර දිස්ත්‍රික්කයේ සහ නුවරඑළිය දිස්ත්‍රික්කයේ උඩහේවාහැට කොට්ඨාශයේ සහල් විකිණිය හැකි වැඩිම මිළ ගණන් නියමිත අංක කේ.ඩී. 70 සහ 1959 යේ පෙබරවාරි මස 10 වෙනි දින දරණ ආහාර මිළ නියෝගය 1959 යේ ජූනි මස 15 වෙනි දින සිට අවලංගු කරමි.

(2) 1959 යේ ජූනි මස 15 වෙනි දින සිට මීට යාකොට ඇති පළමුවන උපලේඛනයේ පළමුවන තීරයේ සඳහන් පෙදෙස්වල එම උපලේඛනයේ දෙවන තීරයේ විශේෂිත මිළ ගණන් (සුද්ධ බරෙන්) නියමිත සහල් ප්‍රමාණයෙන් පළමුවන බාගය සඳහා බෙදා හරින සහල් හොණ්ඩරයක් විකිණිය යුතු වැඩිම තොග මිළ ගණන් වන අතර ඒ මිළ ගණන් වලට වඩා වැඩියෙන් තොග වශයෙන් මෙම සහල් නොවිකිණිය යුතු බව මෙයින් නියෝග කරමි.

(3) 1959 යේ ජූනි මස 15 වෙනි දින සිට මීට යාකොට ඇති පළමුවන උපලේඛනයේ පළමුවන තීරයේ සඳහන් පෙදෙස්වල එම උපලේඛනයේ තුන්වෙනි තීරයේ විශේෂිත මිළ ගණන් (සුද්ධ බරෙන්) නියමිත සහල් ප්‍රමාණයෙන් දෙවන බාගය සඳහා බෙදා හරින සහල් හොණ්ඩරයක් විකිණිය යුතු වැඩිම තොග මිළ ගණන් වන අතර ඒ මිළ ගණන් වලට වඩා වැඩියෙන් තොග වශයෙන් මෙම සහල් නොවිකිණිය යුතු බව මෙයින් නියෝග කරමි.

(4) 1959යේ ජූනි මස 15 වෙනි දින සිට මීට යාකොට ඇති දෙවන උපලේඛනයේ පළමුවන තීරයේ සඳහන් පෙදෙස්වල එම උපලේඛනයේ දෙවන තීරයේ විශේෂිත මිළ ගණන් (සුද්ධ බරෙන්) නියමිත සහල් ප්‍රමාණයෙන් පළමුවන බාගය සඳහා බෙදා හරින සහල් රාත්තලක් විකිණිය යුතු වැඩිම සිල්ලර මිළ ගණන් වන අතර ඒ මිළ ගණන් වලට වඩා වැඩියෙන් සිල්ලර වශයෙන් මෙම සහල් නොවිකිණිය යුතු බව මෙයින් නියෝග කරමි.

(5) 1959 යේ ජූනි මස 15 වෙනි දින සිට මීට යාකොට ඇති දෙවන උපලේඛනයේ පළමුවන තීරයේ සඳහන් පෙදෙස්වල එම උපලේඛනයේ තුන්වන තීරයේ විශේෂිත මිළ ගණන් (සුද්ධ බරෙන්) නියමිත සහල් ප්‍රමාණයෙන් දෙවන බාගය සඳහා බෙදා හරින සහල් රාත්තලක් විකිණිය යුතු වැඩිම සිල්ලර මිළ ගණන් වන අතර ඒ මිළ ගණන් වලට වඩා වැඩියෙන් සිල්ලර වශයෙන් මෙම සහල් නොවිකිණිය යුතු බව මෙයින් නියෝග කරමි.

(6) තවද, මෙම නියෝගයෙහි කාර්‍යය සඳහා—

(අ) මොනම සහල් ප්‍රමාණයක් වුවත් යළිත් විකිණීම සඳහා විකිණීමක් වුවහොත් ඒ විකිණීම තොග වශයෙන් විකිණීමක් බැව් ගණන් ගතයුතු බවත් ;

(ආ) මොනම සහල් ප්‍රමාණයක් වුවත් පරිභෝගය සඳහා හෝ පාවිච්චිය සඳහා විකිණීමක් වුවහොත් එම විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් බව ගණන් ගත යුතු බවත් ; සහ

(ඇ) තොග වශයෙන් විකුණන සුද්ධ බර හොණ්ඩරයකට අඩු හෝ වැඩි ඕනෑම සහල් ප්‍රමාණයකට ගෙවිය යුතු වැඩිම මුදල ගණන් ගනු ලබන්නේ මෙහි සඳහන් සුද්ධ බර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණීමේ වැඩිම මිළ අනුව බවත්, මෙම නියෝගයෙන් නියම කරමි ;

(ඈ) ''රාත්තල්'' හෙවත් ''රා'' යන්නෙන් සළකනු ලබන්නේ ඇවර්දුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද, නියම කරමි ;

(ඉ) නියමිත සහල් ප්‍රමාණයෙන් පළමුවන බාගය සඳහා දිය යුතු සියළුම සහල් බෙදා හරින තුරු දෙවන බාගය සඳහා සහල් බෙදා හැරීමක් නොවිය යුතු බව මෙයින් නියෝග කරමි ;

(ඊ) නියමිත සහල් ප්‍රමාණය යන්නෙන් හැඟවෙන්නේ ආහාර පාලන පණත අනුව එවෙලට දිය යුතු සහල් ප්‍රමාණය බව මෙයින් නියෝග කරමි.

1633—ජේ. ඇන්. ආර් 2528—4,425 (6/59)

(7) එසේම, මෙම නියෝගයෙහි සඳහන් සහල් විකිණිය හැකි වැඩිම මිළ ගණන් බල පවත්නා සෑම පෙදෙසකම වෙන ද්‍රව්‍යකට කලවම් කොට බාල කොට කිසිවෙක් සහල් නොවිකිණිය යුතු බව නියම කරමි.

(8) එසේම, මෙම නියෝගයේ සඳහන් සහල් විකිණිය හැකි වැඩිම මිළ ගණන් බලපවත්නා සෑම පෙදෙසකම යම් තැනෙක හෝ වාහනයක් තුළ හිමිවීමක් හෝ පාලනයක් යටතේ සහල් තබා ගෙන සිටින සෑම වෙළෙන්දකුම එම පෙදෙසේ සහල් විකිණිය යුතු වැඩිම මිළ ගණන් දක්වන නිවේදනයක් එකී ස්ථානයේ හෝ වාහනයේ හොඳින් පෙනෙන සේ ප්‍රදර්ශනය කර තැබිය යුතු බැව් නියම කරමි.

(9) එසේම, මේ නියෝගයේ සඳහන් සහල් විකිණිය හැකි වැඩිම මිළ ගණන් බල පවත්නා සෑම පෙදෙසකම තොග වශයෙන් සහල් විකුණන සෑම කෙනෙකුම සහල් මිළදී ගන්නා ඉල්ලුවහොත්, ඔහුට රිසිට් පතක් දිය යුතු බව මෙයින් නියෝග කරමි. එම රිසිට් පතෙහි පහත සඳහන් දෑ අඩංගු විය යුතුයි :—

(අ) විකුණූ දිනය ;
(ආ) විකුණූ ප්‍රමාණය ;
(ඇ) විකුණූ ප්‍රමාණයට ගෙවූ මුදල ;
(ඈ) වෙළඳාම කුමක්ද යන බව, එනම් තොග වශයෙන් ද සිල්ලර වශයෙන්ද යන බව.

(10) එසේම, සහල් විකුණන විට ඔතන දෙයෙහි නැතහොත් බහාලන දෙයෙහි මිළද මෙම නියෝගයෙහි නියම කරන ලද විකිණිය හැකි වැඩිම මිළ ගණන් වලට ඇතුළත් වන බැව් මෙයින් නියෝග කරමි.

1959යේ ජූනි මස 15 වෙනි දින පස්වරු 3.05ටය.

ඒ. බී. ඇස්. ඇන්. පුල්ලෙනායගම්,
මහනුවර දිස්ත්‍රික්කයේ සහ නුවරඑළි දිස්ත්‍රික්කයේ උඩහේවාහැට කොට්ඨාශයේ නියෝජ්‍ය ආහාර මිළ පාලක.

## පළමුවන උපලේඛනය

| පළමුවන තීරුව<br>පෙදෙස | දෙවන තීරුව<br>නියමිත සහල් ප්‍රමාණයෙන් පළමුවන බාගය සඳහා බෙදා හරින සහල් වල සුද්ධ කිරුමෙන් හොණ්ඩරයක් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. | තුන්වන තීරුව<br>නියමිත සහල් ප්‍රමාණයෙන් දෙවන බාගය සඳහා බෙදා හරින සහල් වල සුද්ධ කිරුමෙන් හොණ්ඩරයක් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. |
|---|---|---|
| (අ) මහනුවර දිස්ත්‍රික්කය— | | |
| (1) මහනුවර නාගරිකය සහ ගඟවට කෝරළය | 13 87 | 25 07 |
| **උඩුනුවර සහ යටිනුවර** | | |
| (2) කටුලියද්ද | 13 88 | 25 08 |
| (3) ගෙලිඔය | 13 97 | 25 17 |
| (4) පිටුනුගම, ගන්නෝරුවේ, මැණික්දිවෙල සහ දවුලාගල | 14 01 | 25 21 |
| (5) වේදිරිප සහ මුරුතලාව | 13 99 | 25 19 |
| (6) වට්ටප්පොළ | 14 11 | 25 31 |
| (7) කඩුගන්නාව | 13 88 | 25 08 |
| (8) ඊරියගම, පේරාදෙනිය | 13 89 | 25 09 |
| (9) බත්ගොඩ පිටිය | 14 06 | 25 26 |
| (10) පොත්තපිටිය | 14 01 | 25 21 |
| (11) අලකොලාහ | 13 93 | 25 13 |
| **තුන්පනේ** | | |
| (12) ගලගෙදර | 14 24 | 25 44 |
| (13) හතරලියද්ද | 14 07 | 25 27 |
| **හාරිස්පත්තුව** | | |
| (14) අරඹේකඩේ, පූජාපිටිය සහ කුරුගොඩ | 14 11 | 25 31 |
| (15) හැදෙනිය, කුළුගම්මන, විගිහුම්පොල, අකුරණ සහ වැරැල්ලගම | 14 06 | 25 26 |
| (16) බරිගම | 14 01 | 25 21 |
| (17) යටිවැවල | 13 97 | 25 17 |
| (18) වෙලේකඩේ | 14 01 | 25 21 |
| (19) පලිපාන | 14 21 | 25 41 |
| (20) අලවතුගොඩ | 14 19 | 25 39 |
| (21) ගල්හින, අංකුඹුර | 14 50 | 25 70 |
| **පාතදුම්බර** | | |
| (22) වත්තේගම | 14 01 | 25 21 |
| (23) තෙල්දෙනිය | 14 31 | 25 51 |
| (24) පන්විල | 14 23 | 25 43 |
| (25) මඩවල | 14 10 | 25 30 |
| (26) නවයාලතැන්න, කටුගස්තොට | 13 89 | 25 09 |
| (27) පරණගම | 14 29 | 25 49 |
| (28) හුළුගඟ | 14 25 | 25 65 |
| (29) කෙන්ගල්ල | 14 36 | 25 56 |
| (30) දිගන | 14 27 | 25 47 |
| (31) අඹකැන්න | 13 97 | 25 17 |
| (32) මැණික්හින්න | 14 20 | 25 40 |
| **උඩදුම්බර** | | |
| (33) උඩිස්පත්තුව | 14 32 | 25 52 |
| (34) ඌරුගල | 14 36 | 25 66 |
| (35) හුන්නස්ගිරිය | 14 59 | 25 79 |
| (36) මොරගහමුල | 14 43 | 25 63 |

| පළමුවන තීරුව<br>පෙදෙස | දෙවන තීරුව<br>නියමිත සහල් ප්‍රමාණයෙන් පළමුවන බාගය සඳහා බෙද හරින සහල් වල සුද්ධ කිරුමෙන් හොණ්ඩරයක් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. | තුන්වන තීරුව<br>නියමිත සහල් ප්‍රමාණයෙන් දෙවන බාගය සඳහා බෙද හරින සහල් වල සුද්ධ කිරුමෙන් හොණ්ඩරයක් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. |
|---|---|---|
| **පාතහේවාහැට** | | |
| (37) මාරස්සන ... ... ... ... | 14 41 ... | 25 61 |
| (38) පට්ටියගම වෙළඳපොල ... ... ... | 14 53 ... | 25 73 |
| (39) තලාතුඔය ... ... ... ... | 14 20 ... | 25 40 |
| (40) ගලහ ... ... ... ... | 14 36 ... | 25 56 |
| (41) අම්පිටිය ... ... ... ... | 14 15 ... | 25 35 |
| **උඩපලාත** | | |
| (42) ගම්පොල ... ... ... ... | 13 84 ... | 25 04 |
| (43) උළපනේ ... ... ... ... | 14 08 ... | 25 28 |
| (44) පුස්සැල්ලාව ... ... ... ... | 14 32 ... | 25 52 |
| (45) උඩුවෙල ... ... ... ... | 14 63 ... | 25 83 |
| (46) කලුගමුව ... ... ... ... | 14 15 ... | 25 35 |
| (47) මුල්ගම ... ... ... ... | 14 50 ... | 25 70 |
| **උඩබුලත්ගම** | | |
| (48) නාවලපිටිය ... ... ... ... | 14 10 ... | 25 30 |
| (49) හැටන් ... ... ... ... | 14 27 ... | 25 47 |
| (50) නෝවුඩ් ... ... ... ... | 14 48 ... | 25 68 |
| (51) බගවන්තලාව ... ... ... ... | 14 83 ... | 26 03 |
| (52) ගිණිගත්හේන ... ... ... ... | 14 57 ... | 25 77 |
| (53) මස්කෙළිය, අක්කරවත්ත, නෝටන් බ්‍රිජ්, හාර්නිස් ... ... | 14 81 ... | 26 01 |
| **(ආ) නුවරඑළි දිස්ත්‍රික්කයේ උඩහේවාහැට කොට්ඨාශය** | | |
| (54) පදියපැලැල්ල ... ... ... ... | 14 67 ... | 25 87 |
| (55) මතුරට ... ... ... ... | 14 95 ... | 26 15 |
| (56) මානකොළ ... ... ... ... | 14 67 ... | 25 87 |
| (57) රිකිල්ලගස්කඩ ... ... ... ... | 14 57 ... | 25 77 |
| (58) රහතුන්ගොඩ ... ... ... ... | 14 64 ... | 25 84 |
| (59) හඟුරන්කෙත ... ... ... ... | 14 46 ... | 25 66 |
| (60) මුදුනපිට ... ... ... ... | 14 67 ... | 25 87 |
| (61) කරලියැද්ද ... ... ... ... | 14 78 ... | 25 98 |

## දෙවන උපලේඛනය

| පළවෙනි තීරුව<br>පෙදෙස් | දෙවන තීරුව<br>නියමිත සහල් ප්‍රමාණයෙන් පළමුවන බාගය සඳහා බෙද හරින සහල්වල සුද්ධ කිරුමෙන් සිල්ලර වශයෙන් රාත්තලක් විකිණිය යුතු වැඩිම මිළ<br>රු. ශ. | තුන්වන තීරුව<br>නියමිත සහල් ප්‍රමාණයෙන් දෙවන බාගය සඳහා බෙද හරින සහල්වල සුද්ධ කිරුමෙන් සිල්ලර වශයෙන් රාත්තලක් විකිණිය යුතු වැඩිම මිළ<br>රු. ශ. |
|---|---|---|
| **(අ) මහනුවර දිස්ත්‍රික්කය—** | | |
| 1. මහනුවර නාගරික හා ගහවට කෝරළය ... ... ... | 0 13 ... | 0 23 |
| **උඩුනුවර සහ යටිනුවර** | | |
| 2. කඹුරාදෙනිය, කැලියල්පිටිය, කුරුකුත්තල ... ... ... | 0 13½ ... | 0 23½ |
| 3. ආඩියතැන්නවත්ත ... ... ... ... | 0 13½ ... | 0 23½ |
| 4. උඩුනුවර, යටිනුවර කොට්ඨාශයේ ඉතිරි පෙදෙස් ... ... | 0 13 ... | 0 23 |
| **තුම්පණේ** | | |
| 5. ගලගෙදරමඩිගේ, ගලගෙදර ... ... ... ... | 0 13 ... | 0 23 |
| 6. වැත්තැව, මිණිගමුව, කුරගම, හද්දපිටිය, පොල්වත්ත, කනක්කරපොළ, වැලිගොඩ පොල, අවුල්බෝදල, අලගල්ල, පට්ටපොල, දෙහිදෙණිය, මඩිගේ, දෙහිදෙණිය, පලැන, රන්ගමුව, ගුණදහ, උඩුව, ගල්දෙල ... ... ... | 0 13½ ... | 0 23½ |
| 7. තුම්පනේ කොට්ඨාශයේ ඉතිරි පෙදෙස් ... ... ... | 0 13½ ... | 0 23½ |
| **හාරිස්පත්තුව** | | |
| 8. නයංගොඩ, බෙරගම, වල්ගම, මැදවල, මරවානාගොඩ, කුරුඳුගොල්ල, බරිගම, වැරැල්ලගම, කුළුගම්මන, යටිවැවල, කොණ්ඩදෙනිය, කහවත්ත, පලිපාන, මුල්ලෙගම, අකුරණ, කුරුගොඩ, කුඹුරේගොඩ, කුඹුරේගම, උගුරැස්සපිටිය, අලගොඩ, මාවතපොල, දෙරනෑගම, හපුගොඩ, බුලුගොහොතැන්න, ඕවිස්ස, බටුගොඩ, ජීවානාවත්ත, බෝතොට ... ... ... | 0 13 ... | 0 23 |
| 9. හාරිස්පත්තුව කොට්ඨාශයේ ඉතිරි පෙදෙස් ... ... ... | 0 13½ ... | 0 23½ |

| පළවෙනි තීරුව<br>පෙදෙස් | දෙවන තීරුව<br>නියමිත සහල් ප්‍රමාණයෙන් පළමුවන බාගය සඳහා බෙද හරින සහල්වල සුද්ධ කිරු මෙන් සිල්ලර වශයෙන් රාත්තලක් විකිණිය යුතු වැඩිම මිළ<br>රු. ශ. | තුන්වන තීරුව<br>නියමිත සහල් ප්‍රමාණයෙන් දෙවන බාගය සඳහා බෙද හරින සහල්වල සුද්ධ කිරු මෙන් සිල්ලර වශයෙන් රාත්තලක් විකිණිය යුතු වැඩිම මිළ<br>රු. ශ. |
|---|---|---|
| **පාතදුම්බර** | | |
| 10. වත්තේගම, යටියාවන, පල්ලේගම, මැණික්හින්න, නවයාලතැන්න, පන්විල, පිටියේගෙදර, මඩවල, මඩිගේ, නාපාන ... ... ... | 0 13 ... | 0 23 |
| 11. උඩුරාවන, යටවර, හුරිකඩුව, කුණ්ඩසාලේ, මහවත්ත, මඩොල්කැලේ, කළල, මීගම්මන, හුරිකඩුවමඩිගේ, අත්තරගල්ල, පල්ලේගම, අත්තරගල්ල උඩගම, අරත්තන උඩගම, අරත්තන පල්ලේගම, පල්ලේගම, විළවල, ගුන්නැපාන, දෙරගමුව, තෙල්දෙනිය නගරය, තෙල්දෙණියගම, වැවේගම, කරලියද්ද, කුඹුක්කඳුර, රඹුක්වැල්ල, අමුණුගම, සිරිමල්වත්ත, හුලුගහ, බැද්දේගම, කෙන්ගල්ල ... ... ... ... | 0 13½ ... | 0 23½ |
| 12. නත්තරන්පොත, නාරන්පනාව, දඹරාව, උඩුගොඩ, ගිද්දව, ගොමගොඩ, ගෝනවල, කුඹුල්ලොලුව ... ... ... ... | 0 13½ ... | 0 23½ |
| 13. වේරපිටිය, කොස්ගම, වටපාන, මහුසා, ගල්බොඩවත්ත ... ... | 0 14 ... | 0 24 |
| 14. වේඩරුව ... ... ... ... ... | 0 14½ ... | 0 24½ |
| 15. පාතදුම්බර කොට්ඨාශයේ ඉතිරි පෙදෙස් ... ... ... | 0 14 ... | 0 24 |
| **උඩදුම්බර** | | |
| 16. උඩිස්පත්තුව නගරය, ගබ්බල, පල්ලබාගේ, ගබ්බල උඩබාගේ, පොද්දල්ගොඩ, බෝමුරේ, වටුලියැද්ද, නුගතැන්න ... ... ... | 0 13½ ... | 0 23½ |
| 17. අම්බාලේ, දුණුවිල, ගංගොඩ, හාලිඇල, තලගුණමහවෙල, උඩවෙල, පල්ලෙවෙල ... | 0 13½ ... | 0 23½ |
| 18. වේරගම ... ... ... ... ... | 0 14 ... | 0 24 |
| 19. මීමුරේවසම ... ... ... ... | 0 15½ ... | 0 25½ |
| 20. උඩත්තාව, මඩුගල්ල ... ... ... ... | 0 14½ ... | 0 24½ |
| 21. උඩදුම්බර කොට්ඨාශයේ ඉතිරි පෙදෙස් ... ... ... | 0 14 ... | 0 24 |
| **පාතහේවාහැට** | | |
| 22. නෙහිනවල ... ... ... ... | 0 13½ ... | 0 23½ |
| 23. අම්පිටිය, පල්ලේගම, හිප්පොල, කොස්හින්න, කෙටවල, අම්පිටිය, උඩගම ... | 0 13 ... | 0 23 |
| 24. ගලහ, දෙල්තොට, නුගලියැද්ද, බුටාවත්ත, ගොඩමුන්න, හපුතලේපල්ලේ ගම, හපුතලේ උඩගම, දුල්මුරේ, කපුලියැද්ද, ගුරුදෙණියැ තැන්නේකුඹුර, මාරස්සන, කන්දේවෙල ... ... ... ... | 0 13½ ... | 0 23½ |
| 25. පට්ටියගම, උඩපිටිය, වනහපුව, මහමැදගම උඩුවෙල ... ... | 0 14 ... | 0 24 |
| 26. බෝපිටිය, කලව්ටතැන්න ... ... ... ... | 0 14 ... | 0 24 |
| 27. ඇතුල්ගම, හේවාවිස්ස ... ... ... ... | 0 14½ ... | 0 24½ |
| 28. පාතහේවාහැට කොට්ඨාශයේ ඉතිරි පෙදෙස් ... ... ... | 0 13½ ... | 0 23½ |
| **උඩපලාත** | | |
| 29. ගම්පොල, උළපනේ, අටබාගේ, පල්ලේගම, ගල්අට, බෝවල, නාරන්විට, කිරින්ද වල්ලහගොඩ, දෙල් පිටිය, ඉහුරුවත්ත, අටබාගේ–වෙළඳපොල, ගම්පොළවෙල, රත්මල්කඩුව, අන්ගම්මන, කහටපිටිය කුඩමාකේ, හෙරකෙලැ මාවතුර, ලැඟුන්දෙනිය, ගිරිඋල්ල, පුපුරැස්ස, යටපාන, පල්ලේපිටිය, පන්විලතැන්නැ, කලුගමුව, උඩහේන්තැන්න ... ... ... | 0 13 ... | 0 23 |
| 30. අටබාගේ ඉහළගම ... ... ... ... | 0 14½ ... | 0 24½ |
| 31. අටබාගේ උඩගම ... ... ... ... | 0 13½ ... | 0 23½ |
| 32. දුණුකේවිල ... ... ... ... ... | 0 14 ... | 0 24 |
| 33. දෙළුව, අලුගොල්ල, හිඳගල, මියගොල්ල, පුස්සැල්ලාව, පටිතලාව ... | 0 13½ ... | 0 23½ |
| 34. උඩුවෙල ... ... ... ... ... | 0 14 ... | 0 24 |
| 35. උඩපළාත කොට්ඨාශයේ ඉතිරි පෙදෙස් ... ... ... | 0 13½ ... | 0 23½ |
| 36. උඩබුලත්ගම, නාවලපිටිය, පැණිතුඩුව, මාම්පිටිය, කරහඳුන්ගල, බව්වාගම ... | 0 13 ... | 0 23 |
| 37. රඹුක්පිටිය, පල්ලෙගම, කඩියන්ලෙන, දෙකිඳ, නෝර්වුඩ්, හැටන්, දික්ඔය, රොසැල්ල, කාෆැක්ස්, ෆ්‍රොට්හිල්, වැලිගම්පොල ... ... | 013½ | 0 23½ |
| 38. ගිණිගත්හේන, කඩවල, මස්කෙළිය, නෝටන්බ්‍රිජ්, හානිෂ්-වටවල, අඹගමුව, උතුරු යටිගන්හුලහ, දකුණු යටිගන්හුලහ, කලුගල, පොල්පිටිය, හෝමගම ... | 0 13½ ... | 0 23½ |
| 39. අක්කරවත්ත ... ... ... ... | 0 14 ... | 0 24 |
| 40. කිත්ටයර් වෙළඳපොල–කිත්ටයර්ගම ... ... ... | 0 14 ... | 0 24 |
| 41. තියන්සින් ... ... ... ... ... | 0 14 ... | 0 24 |
| 42. අප්කොට් කිරිවන්එළිය, පතන, කැලැවැල්දෙනිය, බගවන්තලාව ... | 0 14 ... | 0 24 |
| 43. හඟරාපිටිය ... ... ... ... | 0 15½ ... | 0 25½ |
| 44. උඩබුලත්ගම කොට්ඨාශයේ ඉතිරි පෙදෙස් ... ... ... | 0 14½ ... | 0 24½ |
| **(ආ) නුවරඑළි දිස්ත්‍රික්කයේ උඩහේවාහැට කොට්ඨාශය** | | |
| 45. රිකිල්ලගස්කඩ, හඟුරන්කෙත, මාඔය, මාදන්වල ... ... ... | 0 13½ ... | 0 23½ |
| 46. පදියපැලැල්ල, කහටදණ්ඩ, අලපලාතැන්න, ඉඩම්පිටිය, යටිවැවල, මුන්වත්ත, උඩපදියපලැල්ල, වැල්ලගිරිය, මැටිබෙඹය, මානකොළ, තුම්පැල හපුව, දෙනිකේ, ගලුකේ, විල්වල, එල්ගම, දෙහිපේ, පොරමඩුල්ල, ඇකිරිය, හපුගස් දෙණිය, වලුගම, දෙඩම්කුඹුර, කටුගස්හින්න, උනන්තැන්න, මුදුසිට, ගලඋඩ, උඩගම, කරලියැද්ද, ඉඩමෙලන්ද බටගොල්ල, රහතුන්ගොඩ ... | 0 14 ... | 0 24 |
| 47. ඇහලගස්තැන්න, උණගොල්ල, උඩඩෙල, මතුරට, ලුණුකේබැද්ද, කොටයාපතන, ඉල්ලගොල්ල, උඩවත්ත, බඹරගම ... ... ... | 0 14 ... | 0 24 |
| 48. වටගේපොත ... ... ... ... | 0 14½ ... | 0 24½ |
| 49. උඩහේවාහැට කොට්ඨාශයේ ඉතිරි පෙදෙස් ... ... ... | 0 14½ ... | 0 24½ |

**සැලකිය යුතුයි.**—මේ මිළ ගණන් සහල් විකිණිය යුතු නියම මිල ගණන් නොවේ. ඒ මිළ ගණන් සහල් විකිණිය හැකි වැඩිම මිළ ගණන්ය. ඒවාට වඩා වැඩි මිළට සහල් විකිණිය යුතු නොවේ.

ජේ/13/1959 වැනි අංකය දරණ ආහාර මිළ නියෝගය

අතිරේක ආහාර ද්‍රව්‍ය
(මයිසූර් පරිප්පු හා උම්බලකඩ)

## 1950 අංක 29 දරණ මිළ පාලන පනත

### නියෝගය

යාපන පාලන දිස්ත්‍රික්කයේ උප (ආහාර) මිළ පාළක තැන්පත් වෙල්ලයියා නික්කුණානන්දම් වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 4 වැනි වගන්තියේ 3 (2) වැනි වගන්තියෙන් එකී සහකාර (ආහාර) මිළ පාලක තැන කෙරෙහි පැවරී තිබෙන බලතල අනුව—

(1) 1958.9.15 වැනි දින අංක 11,525 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරණ ලද 1958.9.10 දින ජේ/7/58, දරණ ආහාර මිළ නියෝගයේ 1 වැනි හා 2 වැනි උප ලේඛනයේ 1 වැනි තීරවල සඳහන් මයිසූර් පරිප්පු හා උම්බලකඩ පිළිබඳව එම උප ලේඛන යෙහිම 2 වැනි හා 3 වැනි තීරවල සඳහන් තොග වෙළෙන්දෙකුගේ වැඩිම තොග වෙළඳ මිළද සිල්ලර වෙළෙන්දෙකුගේ වැඩිම සිල්ලර වෙළඳ මිළද, මෙම නියෝගයෙන් අද සිට අවලංගු කරමි.

(2) මීට යාකර ඇති 1 වැනි උප ලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් ද්‍රව්‍ය තොග වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් විකිණීමේදී ශුද්ධ බර හොණ්ඩරයක්ද, සිල්ලර වෙළෙන්දෙකු විසින් පාරිභෝගිකයකුට සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක්ද යාපන ආදයම් පාලක නිලධාරි කොට්ඨාශය තුළ (යාපන නාගරික සහා ප්‍රදේශය ඇතුළුව) විකිණිය හැකි වැඩිම මිළ මේ 1 වැනි උප ලේඛනයෙ 2 වැනි හා 3 වැනි තීරවල අනුපිළිවෙලින් සඳහන් කර තිබෙන මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) මෙයට යාකර ඇති 2 වැනි උප ලේඛනයෙහි 1 වැනි තීරයේ සඳහන් ප්‍රදේශයන්හි 1 වැනි උප ලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් ද්‍රව්‍ය සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක්ද තොග වශයෙන් විකිණීමේදී දළ බර හොණ්ඩරයක්ද, යාපන ආදයම් පාළක නිලධාරි කොට්ඨාශය තුළ (යාපන නගර සභා ප්‍රදේශයත් ඇතුළුව) 2 වැනි උප ලේඛනයේ 2 වැනි හා 3 වැනි තීරවල අනුපිළිවෙලින් වැඩිකර තිබෙන මිළ ගණන් බවද, පළමු වැනි උප ලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් ද්‍රව්‍ය 2 වැනි උප ලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් ප්‍රදේශයන් හි 2 වැනි උප ලේඛනයේ 2 වැනි හා 3 වැනි තීරවල සඳහන් මිළ ගණන්වලට වැඩියෙන් විකිණීම තහනම් බවද නියෝග කරමි.

(4) මෙම උප ලේඛනයෙහි සඳහන් ද්‍රව්‍ය පිළිබඳව 1958.9.15 දින අංක 11,525 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1958.9.10 දින අංක ජේ/7/1958 වෙනි ආහාර මිළ නියෝගයේ IV සිට IX දක්වා ඡේදයන් මෙම මිළ නියෝගයෙහිම අන්තර්ගත වූ හැටියට සැලකිය යුතු ලෙසද මෙම නියෝගයෙන් නියම කරමි.

1959 ජූනි මස 17 වෙනි අ. භා. 2.43 ට යාපනේ කච්චේරියේදී අත්සන් කරන ලදී.

සී. නික්කුණානන්දම්,
යාපන දිස්ත්‍රික්කයේ උප (ආහාර) මිළ පාලක තැන.

### 1 වැනි උප ලේඛනය

| | 1 වැනි තීරය<br>විස්තර | 2 වැනි තීරය<br>තොග වෙළෙන්දෙකු විසින් සිල්ලර වෙළෙන්දෙකුට දළ බර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. | 3 වැනි තීරය<br>සිල්ලර වෙළෙන්දෙකු විසින් ශුද්ධ බර රාත්තලක් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. |
|---|---|---|---|
| 1. | මයිසූර් පරිප්පු ... ... ... | 51 85 ... | 0 51 |
| 2. | උම්බලකඩ ... ... ... | 213 85 ... | 2 13 |

### 2 වැනි උප ලේඛනය

| | 1 වැනි තීරය<br>ප්‍රදේශය | 2 වැනි තීරය<br>තොග වෙළෙන්දෙකු විසින් දළ බර හොණ්ඩරයක් යාපන ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශය තුළ (යාපන නාගරික සීමාව ඇතුළත) නියමිත මිළට වඩා වැඩිම මිළ<br>රු. ශ. | 3 වැනි තීරය<br>සිල්ලර වෙළෙන්දෙකු විසින් ශුද්ධ බර රාත්තලක් යාපන ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශය තුළ (යාපන නගර සභා සීමාව ඇතුළත) නියමිත මිළට වඩා වැඩිම මිළ<br>රු. ශ. |
|---|---|---|---|
| 1. | වලිකාමම් උතුර, බටහිර, නැගෙනහිර, තෙන්මරාච්චි ප්‍රදේශ හා දූපත් ප්‍රදේශය තුළ පිහිටි කයිට්ස් සුළු නගර සභා සීමාව හා කාරදිව් දූපත ... ... | 0 50 ... | 0 01 |
| 2. | කයිට්ස් සුළු නගර සභා සීමාව හා කාරදිව් දූපත හැර දූපත ප්‍රදේශය, වඩමරාච්චි, පච්චිලා පාලෙයි, හා කරාච්චි ප්‍රදේශ ... ... ... ... | 0 70 ... | 0 01 |
| 3. | ඩෙල්පට් ප්‍රදේශය ... ... ... ... | 0 90 ... | 0 01 |
| 4. | පූනකරි–තුනුක්කායි ප්‍රදේශයේ පූනකරි උඩයාර්ගේ ප්‍රදේශය ... ... | 0 90 ... | 0 01 |
| 5. | පූනකරි–තුනුක්කායි ප්‍රදේශයේ පල්ලවරායන් කඩ්ඩු උඩයාර්ගේ ප්‍රදේශය ... | 1 10 ... | 0 01 |
| 6. | පූනකරි–තුනුක්කායි ප්‍රදේශයේ තුනුක්කායි උඩයාර් ප්‍රදේශය ... ... | 1 30 ... | 0 01 |

**සැලකිය යුතුයි.**—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණීමේ නියමිත මිළ නොව, ඒ ද්‍රව්‍ය විකිණිය හැකි වැඩිම මිළ ගණන්ය.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.